# 2022ජනවාරිමස 18වනදිනගඟ ඉහළකෝරළේ ප්‍රාදේශීයසභාවේපැවතිමහාසභා රැස්වීම්වාර්තාව

දිනයසහවේලාව :- 2022.01.18පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළකෝරළේ ප්‍රාදේශීයසභා රැස්වීම්ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීරබණ්ඩාරජයසේකරමහතා | ගරු ප්‍රාදේශීයසභාසභාපති |
| 02. ඒ. මහින්දරත්නඅලුත්ගමගේමහතා | ගරු ප්‍රාදේශීයසභාඋපසභාපති |
| 03. එස්.ඒ.ඩබ්. පතිරණමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 04. ඩී.ඩබ්.නාලකවසන්ත අබේසේකරමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 05. එම්.පී.ප්‍රසන්නවිමල්මනතුංග මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 06. ඩී.පී.පී. විශ්වජිත් ගංගාප්‍රේමලාල් ගුරුගේමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 07.ඒ.පී. කොල්වින්සිල්වාමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 08. සුබෝධා ලක්ෂාණිරිබේරාමහත්මිය | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රිනී |
| 09. ඩබ්.එම්. උදය කුමාරබණ්ඩාරමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 10. ඒ.ඒ. අජිත්ප්‍රියන්ත බණ්ඩාරමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 11.එම්.ඒ.සුමේධඅලුත්ගමගේමහතා | ගරුප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 12. පූජ්‍යපට්ටිපොල සුමනරතනහිමි | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 13. එම්.පී. අබේරත්නබණ්ඩාරමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 14. එස්. නිලාම්මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 15. ඩී.පී. නිරෝෂාදිල්රුක්ෂිකාජයසේකරමහත්මිය | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රිනී |
| 16. එස්.පී. සරත් කුමාර ලාල්මහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 17. රාජකුමාර් විදුෂණීමහත්මිය | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රිනී |

නොපැමිණීම:-

| | |
|---|---|
| 01. ආර්.පී.ගුණරත්නමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 02. චන්ද්‍රා අලුත්ගමගේමහත්මිය | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රිනී |
| 03. එච්.පී.ආනන්ද කුලතිලකමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |
| 04.ආර්.එම්.චාමිකඅනුරාධරත්නායකමහතා | ගරු ප්‍රාදේශීයසභාමන්ත්‍රී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමාවිසින්මහා සභා රැස්වීමේ වැඩකටයුතු ආරම්භකරමින්පැමිණසිටි ගරු උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේලේකම්තුමිය ඇතුළු නිලධාරීන්සියලුදෙනාහාපැමිණසිටිසියලුදෙනාම ගෞරවයෙන්යුතුව පිළිගන්නා ලදී.

සභා රැස්වීමටසහභාගීවූසියල්ලෝම තම ආගමසිහිකරජාතික ගීය ගායනාකිරීමෙන්පසුව මියගියරණවිරුවන්හා මියගිය පළාත්පාලනආයතනනියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක්පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමාවිසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවටඉදිරිපත්කරන ලදී.

## 01.පසුගිය සභා වාර්තාවසම්මත කර ගැනීම

2021 දෙසැම්බර් මස 14 වනදිනපැවතිමහාසභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමාවිසින් ගරු මහාසභාවටඉදිරිපත්කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. විමලසේන පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, පිටු අංක 17හි මාගේ ප්‍රකාශයේ "විශේෂයෙන් කොවිඩ් වසංගතය නිසා අපි අසාර්ථක වුණා කියලයි ගරු අබේරත්න මන්ත්‍රීතුමා දිගින් දිගටම ප්‍රකාශ කළේ " ලෙස පැවසුවේ නෑ. එතුමා පැවසුවේ " කොවිඩ් වසංගතය විශාල ලෙස අසාර්ථක වුණෙ වෙනත් කරුණු නිසා" ලෙසයි පැවසුවේ. එම නිසා " දිගින් දිගටම" යන්න සංශෝධනය කරන්න. එය සභා වාර්තාවට ඇතුළත් විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ පිටු අංක 15හි මාගේ ප්‍රකාශයේදී මා සඳහන් කළා වගා සංග්‍රාමයකට යා යුතුයි, පුරන් කුඹුරු අස්වැද්දිය යුතුයි, ගෙවතු වගාව සඳහා බීජ ලබා දීම වැනි වැඩසටහන් තවදුරටත් සිදු කළ යුතුයි යැයි ප්‍රකාශ කළා. එහෙත් මෙහි එම අර්ථය වෙනස් කර සඳහන් කර තිබෙනවා. ඒවා සංශෝධනය විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත් කරන ලද 2021.12.14 වනදිනපැවතිමහාසභා රැස්වීම් වාර්තාව සංශෝධනවලට යටත්ව සත්‍ය වාර්තාවක් බවටමාවිසින්යෝජනාකරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එමයෝජනාවමාවිසින්ස්ථිරකරනවා.

යෝජනා ස්ථිරත්වයෙන්අනතුරුව2021.12.14 වනදිනපැවතිමහාසභා රැස්වීම් වාර්තාව සංශෝධනවලට යටත්වඒකමතිකවසභාසම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. 2021 මැයි, ජූනි, ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස වලට අදාළ මහා සභා රැස්වීම් වාර්තා වල නිරීක්ෂණ ඇතුළත් කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

02. සහකාර විගණකාධිපතිගේ විමසීම් අංක KDB/E/PS-GIK/05/2021/755 මූල්‍ය විගණනය -2021 සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ඇතුළත් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

03. මධ්‍යම පළාතේ කොවිඩ් 19 එන්නත්කරණ වැඩ සටහන සඳහා මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන විසින් දරණ ලද වියදම් අදාළ පළාත් පාලන ආයතන වල ප්‍රතිපාදන මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරන ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා ඇති අතර ඒ පිළිබඳව අවධානය යොමු කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සභා ගත කරමි.

04. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත කිහිපයක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පිළිබඳව සඳහන් කරමින් ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කර ඇති විමසීම් වාර්තාව සභාගත කරමි.

## 03. සභාවට ලැබීඇතිසංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

## 05:01 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනා

### 05:01:01 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු පහත නම් සඳහන් මාර්ග මැන නිරවුල් කිරීම වෙනුවෙන් වැය වන රුː 554,500.00 ක මුදල එම මැනුම් කටයුතු සිදු කළ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු පී.කේ.ඩබ්. කාරුණාරත්න මහතා වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | මාර්ගයේ නම | මුදල |
|---|---|---|
| 01 | රජ ඇළ අසළ සිට ගම්පොළවෙල ප්‍රාධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාරක කි.මි.01, පළල අඩි 12යි | රුඃ 35,000.00 |
| 02 | ඇත්ගාල ප්‍රධාන පාර කි.මී. 2, පළල අඩි 14 | රුඃ 65,500.00 |
| 03 | සිංහපුරගම මැද පාර මී. 750, පළල අඩි 10 | රුඃ 30,000.00 |
| 04 | වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර, දුර කි.මී. 3.5, පළල අඩි 10 | රුඃ 130,000.00 |
| 05 | යටපාන බුස්නාව හරහා තියඹරාව පාර දුර මී. 750 | රුඃ 37,500.00 |
| 06 | පරගල බස් නැවතුම්පොළ අසළ සිට පරගල නව ජනපදය දක්වා පාර දුර කි.මී. 02, පළල අඩි 10 | රුඃ 89,000.00 |
| 07 | කොළුවල වැලිගිරියේ සිට බටගොල්ල දක්වා පාර දුර කි.මී. 1.7, පළල අඩි 10 | රුඃ 67,500.00 |
| 08 | මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රාධන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය දුර කි.මී. 1.5,පළල අඩි 10 | රුඃ 60,000.00 |
| 09 | අළුගොල්ල සිට රන්තැටියාවත්තට යන පාර දුර කි.මී. 1, පළල අඩි 8 | රුඃ 40,000.00 |
| | එකතුව | රුඃ 554,500.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති බහුතරයක් මාර්ග මැන නිරවුල් කර නොගැනීම හේතුවෙන් ඉතා ගැටළුකාරී තත්ත්වයක් ඇතිව ඇති හෙයින් අදාළ මාර්ග මැනීම් කටයුතු කිරීමට කටයුතු යොදන ලදි. ඒ අතරින් එම මාර්ග මැන නීත්‍යානුකූලව ගැසට් කර ගැනීම අරමුණින් ඉහත මාර්ග 09 මැන අවසන් කර ඇත. එම කටයුතු සිදුකර අවසන් හෙයින් ඊට අදාළ මුදල් ලබා දෙන ලෙස ලියාපදිංචි බලයලත් මිනින්දෝරු පී.කේ.ඩබ්. කාරුණාරත්න මහතා විසින් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඉහත නම් සඳහන් මාර්ග මැන නිරවුල් කිරීම වෙනුවෙන් වැය වන රුඃ 554,500.00 ක මුදල එම මැනුම් කටයුතු සිදු කළ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු පී.කේ.ඩබ්. කාරුණාරත්න මහතා වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

මේ පිළිබඳව වෙනත් අදහසක් හෝ විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

<u>තීරණයඃ-</u>

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඉහත නම් සඳහන් මාර්ග මැන නිරවුල් කිරීම වෙනුවෙන් වැය වන රුඃ 554,500.00 ක මුදල එම මැනුම් කටයුතු සිදු කළ ලියාපදිංචි බලයලත් මිනින්දෝරු -

පී.කේ.ඩබ්. කාරුණාරත්න මහතා වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:02 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

උලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනයේ කසළ අට්ටි ගැසීම සඳහා පවතින ගොඩනැගිල්ලෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවන හෙයින් ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ප්‍රතිපාදන ලබා දීමේ පදනම මත කැඳවා ඇති තොරතුරු අනුව අඩි 200 × අඩි 25 ප්‍රමාණයේ අමානෝ වහල සහිත විවෘත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

උලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනයේ කසළ අට්ටි ගැසීම සඳහා පවතින ගොඩනැගිල්ලෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොමැති වීම මත ගැටළු රාශියකට මුහුණ දී ඇත. දැනට අපි ගම්පොළ නගර සභාව මගින් ලබා දෙන කසළ විශාල ප්‍රමාණයක් එකතු වෙනවා. මෙම ව්‍යාපෘතිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අධීක්ෂණයටද ලක් වුණා. එහිදී මෙම ගොඩනැගිල්ල හදන්න රුː 1,000,000.00ක මුදලක් ඔවුන් අපට ලබා දෙන්න පොරොන්දු වුණා. එම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ මෙහෙය වන ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ප්‍රතිපාදන ලබාදීමේ පදනම මත කැඳවා ඇති තොරතුරු අනුව අඩි 200 × අඩි 25 ප්‍රමාණයේ අමානෝ වහල සහිත විවෘත ගොඩනැගිල්ලක් ඉදිකිරීම ප්‍රතිපාදන ලබා දීමේ පදනම මත කැඳවා ඇති තොරතුරු අනුව අඩි 200 × අඩි 25 ප්‍රමාණයේ අමානෝ වහල සහිත විවෘත ගොඩනැගිල්ලක් ඉදිකිරීමට එකඟතාවයක පල කර තිබෙනවා. ඒ අනුව එම ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මගින් එම ගොඩනැගිල්ල ඉදි කර ගැනීමට ගරු මහා සභාවේ එකඟතාවය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

ගරු සභාපතිතුමනි, මෙය ඉතාම වැදගත් ව්‍යාපෘතියක්. ඩෙන්මාර්ක් කසළ අංගනය පිහිටි භූමිය අවට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් කොටස් ජනපදවාසීන් විසින් බලෙන් අත්පත් කර ගන්නවා. මෙම ඉඩම් කොටස් සභාවට අත්පත් කර ගැනීමට අවශ්‍ය නීත්‍යානුකූල කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමාගේ අදහසට එකඟ වෙනවා. මෙම ඉඩම් අප ව්‍යාපාතියට යොදා ගැනීමට හැකි නම් එය වටිනවා. අපට මෙම ව්‍යාපෘතිය තවත් ඉදිරියට කර ගෙන යාමට එය අවශ්‍යයි. එම ඉඩම ඉතාම ක්‍රමවත්ව පවත්වාගෙන යාම පිළිබඳව පරිසර මහතාට සහ එහි විශාල සේවයක් ඉටු කරන කම්කරුවන්ට මෙහිදී මා ස්තූතිවන්ත වෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් අප වෙත පවරා දෙන්න යැයි එම කොමිෂන් සභාව වෙත ලිපි යොමු කර ඉල්ලීමක් කරන ලෙස විෂයභාර නිලධාරීන්ට උපදෙස් ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණයඃ-

ඒ අනුවඋලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනයේ කසළ අට්ටි ගැසීම සඳහා පවතින ගොඩනැගිල්ලෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවන හෙයින් ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය මගින් ප්‍රතිපාදන ලබා දීමේ පදනම මත කැඳවා ඇති තොරතුරු අනුව අඩි 200 × අඩි 25 ප්‍රමාණයේ අමානෝ වහල සහිත විවෘත ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:03 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

2021.07.20 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 06:05 යටතේ ගනු ලැබූ තීරණයට අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 12 සහ අංක 13 දරණ කඩ කාමර පිටුපස ඇති භාවිතා නොකරන පොදු වැසිකිළිය කඩා ඉවත් කර ඇති හෙයින් එම කඩ කාමර පිටුපසට දිගු කර අලුත්වැඩියා කර ගැනීම එම කඩ හිමියන්ගේ වියදමින් සිදු කිරීම සුදුසු බවටත් එය සභාවෙහි ඇති සැළැස්මට අනුව අප සභාවේ තාක්ෂණ නිලධාරී අධීක්ෂණය යටතේ සිදු කළ යුතු බවටත් තවද එම කඩ කාමර සඳහා නැවත රජයේ තක්සේරුවක් ලබාගෙන එම තක්සේරු වාර්තාව අනුව මාසික කඩ කුලිය අය කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ.මහින්දරත්න අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු අංක 12 සහ අංක 13 දරණ කඩ කාමර පිටුපස ඇති භාවිතා නොකරන පොදු වැසිකිළිය කඩා ඉවත් කිරීමට 2021.07.20 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 06:05 යටතේ තීරණය කළා. එම තීරණයට යටත්ව දැනට එම වැසිකිළිය කඩා ඉවත් කර තිබෙනවා. එය අප සැළැස්මට අනුවමයි ඉදිකිරීම සිදු කරන්නේ. එම කඩ කාමර පිටුපසට දිගු කර අලුත්වැඩියා කර ගැනීම එම කඩ හිමියන්ගේ වියදමින් සිදු කිරීම සුදුසු බවටත් එය සභාවෙහි ඇති සැළැස්මට අනුව අප සභාවේ තාක්ෂණ නිලධාරී අධීක්ෂණය යටතේ සිදු කළ යුතු බවටත් තවද එම කඩ කාමර සඳහා නැවත රජයේ තක්සේරුවක් ලබාගෙන එම තක්සේරු වාර්තාව අනුව මාසික කඩ කුලිය අය කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ.මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි, දැනට පවතින සංශෝධන මිළ ගණන් වලට යටත්ව එම කඩ කාමර වලින් මාසික කුලියද අය කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 12 සහ අංක 13 දරණ කඩ කාමර පිටුපසට දිගු කර අලුත්වැඩියා කර ගැනීම එම කඩ හිමියන්ගේ වියදමින් සිදු කිරීම සුදුසු බවටත් එය සභාවෙහි ඇති සැළැස්මට අනුව අප සභාවේ තාක්‍ෂණ නිලධාරී අධීක්‍ෂණය යටතේ සිදු කළ යුතු බවටත් තවද එම කඩ කාමර සඳහා නැවත රජයේ තක්සේරුවක් ලබාගෙන එම තක්සේරු වාර්තාව අනුව මාසික කඩ කුලිය අය කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:04 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල ක්‍රීඩාංගනය අසළ පුස්තකාල පැවති ගොඩනැගිල්ල තුළ පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා මාසික බදු කුලී පදනම මත ලබා දීම සුදුසු බවට 2021.11.16 වන දින පැවති මහා සභාවේදී තීරණය කළ අතර එම තීරණයට අනුව 2021.11.01 දින සිට 2024.10.30 වන දින දක්වා වූ වසර 03ක කාලයක් සඳහාගිවිසුම් ගතව මාසික කුලී පදනම මත බදුදීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල ක්‍රීඩාංගනය අසළ පුස්තකාල පැවති ගොඩනැගිල්ල තුළ පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා මාසික බදු කුලී පදනම මත ලබා දීම සුදුසු බවට 2021.11.16 වන දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:05 යටතේ තීරණය කළා. එහෙත් එහිදි බදු දෙන කාලසීමාව ගැන තීරණයක් ගෙන නෑ. එම නිසා මෙම ගොඩනැගිල්ල බදු දෙන කාලසීමාව ලෙස 2021.11.01 දින සිට 2024.10.30 වන දින දක්වා වූ වසර 03ක කාලයක් සඳහාගිවිසුම් ගතව මාසික කුලී පදනම මත බදුදීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විෂයභාර ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව විරුද්ධත්වයක්නොමැතිබවපෙනීයනවා.

තීරණය:-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු ඇත්ගාල ක්‍රීඩාංගනය අසළ පුස්තකාල පැවති ගොඩනැගිල්ල තුළ පොලිස් ස්ථානය පවත්වාගෙන යාම සඳහා2021.11.01 දින සිට 2024.10.30 වන දින දක්වා වූ වසර 03ක කාලයක් සඳහා කාලය සඳහා ගිවිසුම් ගතව මාසික කුලී පදනම මත බදුදීම සුදුසු බවටත් ඒ සඳහා ගරු විශයභාර ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:05 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

2022 වර්ෂයට අදාළව පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉල්ලා ඇති අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත පහත සඳහන් සංවර්ධන යෝජනා 12 ට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත මාර්ග, ජල, වෙනත් සේවා සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ආදී ක්ෂේත්‍රයන්ට අදාළව එක් ව්‍යාපාතියක් සඳහා උපරිම මුදල රුපියල් මිලියන 10ක් වන ලෙස සංවර්ධන යෝජනා 12ක් ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා විසින් ඉල්ලීමක් කර තිබෙනවා. එම ඉල්ලීමට අනුව අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් සංවර්ධන යෝජනා 12 ට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය:-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉහත සඳහන් සංවර්ධන යෝජනා 12 ට ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05:01:06 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු සභා ඉඩම් කට්ටි 02ක් වන අංක 04 සහ අංක 05 දරණ ඉඩම් සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටළුව සම්බන්ධයෙන් මීට පෙර කරන ලද සාකච්ඡාවට අනුව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් ලබා ගත් අතර එම උපදෙස් වලට අනුව නීතීඥ මහතාගේ උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදුකරන ලෙස දන්වා ඇත. ඒ අනුව එකී නීති උපදෙස් මේ වන විට ලබාගෙන ඇති අතර එම නීති උපදෙස් පදනම්ව පහත නම් සඳහන් බදුකරුවන් අදාළ හිඟ මුදල් නොගෙවීම හේතුවෙන් ඔවුන්ට විරුද්ධව නීතියානුකූලව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

| ඉඩම් අංකය | සභා ඉඩම් හිමිකරුගේ නම | 2019 මැයි මස සිට හිඟව පවතින මුදල |
|---|---|---|
| 04 | බී.ජී.සී.කේ. සේනාධීර මයා | රු: 175,006.80 |
| 05 | එල්.ටී.වී. ප්‍රේමරත්න මයා | රු: 164,315.00 |
| | මුළු හිඟ මුදල | රු: 339,320.80 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත සභා ඉඩම් බදු දීම මීට වසර ගණනාවකට පෙර ගරු මහා සභා තීරණයකට අනුව පළාත් පාලන කොමසාරිස්, එසේම ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගෙන තමයි මෙම බදුකරුවන් සභාව සමඟ ගිවිසුම්ගතව මෙම ඉඩම් බදු පදනම මත ලබා දුන්නේ. එහෙත් මෑත කාලය වන විට එම ඉඩම් වල නීතියානුකූලව නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඔප්පු ලබාගෙන ඔවුන්ට අයිති යැයි පවසමින් මුදල් ගෙවීම පැහැරහැර තිබෙනවා. සභාව සමඟ ගිවිසුම්ගත වන කාලය තුළ ඔවුන්ට ඔප්පුවක් තිබුණේ නෑ. ඔවුන්ගේ අයිතිය යැයි පවසමින් එහි ඉදිකිරීම් කටයුතුත් සිදු කරනවා. මේ පිළිබඳව අවධානය යොමු කරඉහත අංක සඳහන් ඉඩම් කට්ටි දෙක මෙම සභාවට බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් මීට පෙරදී අප ගරු මහා සභාවේ සාකච්ඡා කළ අතර එහිදී ගනු ලැබූ තීරණයට අනුව පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කළ අතර එම උපදෙස් වලට අනුව නීති උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකරන ලෙස අප වෙත දන්වා ඇත. එහිදී අප විසින් සභාව වෙනුවෙන් පෙනී සිටින නීතීඥ ඩී.එම්.ඒ. මංජුල ක්‍රිෂාන්ත මහතාගෙන් උපදෙස් ලබා ගන්නා ලදි. එම නීති උපදෙස් වලට අනුව අදාළ බදු මුදල් නොගෙවීම සම්බන්ධයෙන් කුරුඳුවත්ත සභා ඉඩම් කට්ටි අංක 04 හිමිකරු වන බී.ජී.සී.කේ. සේනාධීර යන අයට සහ ඉඩම් කට්ටි අංක 05 හිමිකරු වන එල්.ටී.වී. ප්‍රේමරත්න යන අයට විරුද්ධව නඩු දමා සභාවට ගෙවීමට ඇති මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දන්වා ඇත. තවද මොවුන් විසින් සභාව වෙත මුදල් නොගෙවන ලෙස අනෙකුත් ඉඩම් හිමිකරුවන්ටද බලපෑම් කිරීම හේතුවෙන් ඔවුන්ද මුදල් ගෙවීමේ අඩුවක් දක්නට ඇත. මෙම කරුණු සළකා ලබා සභාවට ලැබිය යුතු ආදායම අහිමි කිරීම හේතුවෙන් ඔවුන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව ගරු මහා සභාවේ එකඟතාවය ලබාදෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතාගේ යෝජනාවෙන් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන ස්වාමීන් වහන්සේගේ ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන ස්වාමීන් වහන්සේගේ යෝජනාවෙන් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු මහා සභාවක් බවට පත් කරන ලදි.**

**ගරු සභාපතිතුමා**

**නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සහ ගරු මහා සභාවේ මන්ත්‍රීවරුන් කැඳවා සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසුයි. අප සභාව සතු ගිවිසුමෙහි කොන්දේසි වලට අනුව මාසික බදු අය කර ගැනීමට කටයුතු කිරීම මුලින්ම අයකර ගමු. නඩුමගට ගොස් මෙම හිඟ මුදල් අය කර ගැනීම සුදුසු බවට සියලුදෙනාගේ මතය වේ.ගෙවීම් නොකළොත් එම ස්ථාන සීල් තැබීමට කටයුතු කිරීම ගරු මහා සභාවේ අදහසයි. වෙනත් අදහස් දැක්වීමක් නොමැති බවට පෙනී යනවා.**

**තීරණයඃ-**

**ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත සභා ඉඩම් කට්ටි අංක 04 හිමිකරු වන බී.පී.සී.කේ. සේනාධීර යන අය විසින් සභාවට ගෙවිය යුතු රුඃ175,006.80ක මුදල අය කර ගැනීමට සහ ඉඩම් කට්ටි අංක 05 හිමිකරු වන එල්.ටී.වී. ප්‍රේමරත්න යන අය විසින් සභාවට ගෙවිය යුතු රුඃ339,320.80ක මුදල අය කර ගැනීමට අදාළව ඔවුන්ට විරුද්ධව නඩු දමා සභාවට ගෙවීමට ඇති මුදල් අය කර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**05ඃ01ඃ07 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.**

**ගරු මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද රුඃ 500,000.00ට වඩා වැඩි වටිනාකමක් ඇති පහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

| අනු අංකය | සංවර්ධන ව්‍යාපෘතිය | මුදල | ගෙවීම් කරන ලද සමිතිය හෝ ආයතනය |
|---|---|---|---|
| 01 | වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන හා සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිණිඇල්ල සංචාරක ව්‍යාපෘතිය 1 අදියර සඳහා පළමු ගෙවීම | රුඃ 1,720,618.15 | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් උලපනේ |
| 02 | වෙළඳ වාණිජ හා සංචාරක දෙපාර්තමේන්තු ප්‍රතිපාදන හා සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද අසුපිණිඇල්ල සංචාරක ව්‍යාපෘතිය 1 අදියර සඳහා පළමු ගෙවීම | රුඃ 686,000.00 | මල්වත්ත කන්ස්ට්‍රක්ෂන් උලපනේ |
| 03 | ලෝකානන්ද විහාරස්ථානය අසලින් යන පල්ලේකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම | රුඃ 891,127.37 | උඩහේන්තැන්න ගොවි සංවිධානය, උඩහේන්තැන්න |
| 04 | අසුපිණි ඇල්ල සංචාරක මධ්‍යස්ථානය සඳහා විදුලිය ලබාගැනිම | රුඃ 861,290.00 | සමාන්‍යාධිකාරි , විදුලි බල මණ්ඩලය |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. විමලසේන පතිරණ මහතා**

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

ගරු සභාපතිතුමා

සභාව විසින් ගෙවීම් කරන ලද රුපියල් ලක්ෂ 5කට වැඩි ගෙවීම් සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගත යුතු අතර එම ගෙවීම් කඩිනමින් සිදු කළ යුතු බැවින් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද අතර ඉහත සඳහන් කර ඇති ව්‍යාපෘති සඳහා සභාව වෙත ලැබුණු වෙනත් ප්‍රතිපාදන අදාළ කොන්ත්‍රාත් සමිති සහ ආයතන වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබව හා විරුද්ධත්වයක්නොමැතිබවපෙනීයනවා.

තීරණයඃ-

ඒ අනුවගරු මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කරන ලද රුඃ 500,000.00ට වඩා වැඩි වටිනාකමක් ඇති ඉහත සඳහන් සංවර්ධන ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:08 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේදි ගලවා ඉවත් කරන ලද යකඩ අත්වැට සහ ක්‍රීඩාපිටියේ නැරඹුම් මැදිරියේ භාණ්ඩ වසරකට අධික කාලයක් ක්‍රීඩාපිටිය තුළ තබා ඇති බැවින් වර්ෂාව වැනි ස්වභාවික හේතු නිසා එම ද්‍රව්‍ය දිරාපත් වෙමින් පවතී. එම නිසා අදාළ ද්‍රව්‍ය නැවත භාවිතයට ගනිමින් නැරඹුම් මැදිරිය සහ අත්වැට සකස් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේදි ගලවා ඉවත් කරන ලද යකඩ අත්වැට සහ ක්‍රීඩාපිටියේ නැරඹුම් මැදිරියේ භාණ්ඩ වසරකට අධික කාලයක් ක්‍රීඩාපිටිය තුළ තබා ඇති බැවින් වර්ෂාව වැනි ස්වභාවික හේතු නිසා එම ද්‍රව්‍ය දිරාපත් වෙමින් පවතී. මෙම ද්‍රව්‍ය නැවත භාවිතයට ගැනීමට හැකියාවක් ඇති බැවින් මෙම ද්‍රව්‍ය නැවත භාවිතයට ගනිමින් නැරඹුම් මැදිරිය සහ අත්වැට සකස් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබව හා විරුද්ධත්වයක්නොමැතිබවපෙනීයනවා.

තීරණය:-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීමේදි ගලවා ඉවත් කරන ලද යකඩ අත්වැට සහ ක්‍රීඩාපිටියේ නැරඹුම් මැදිරියේ භාණ්ඩ සහ ද්‍රව්‍ය නැවත භාවිතයට ගනිමින් නැරඹුම් මැදිරිය සහ අත්වැට සකස් කිරීම සුදුසු බවට ගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:09 ගරු සභාපතිතුමාවිසින්ඉදිරිපත්කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

2022 වර්ෂයේ විවිධ අයිතමයන් වෙනුවෙන් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරමි.

| | 2022 වර්ෂයේ -සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| අනු අංකය | ආයතනයේ නම | ලිපිනය | ලියාපදිංචික ළ දිනය | ලදුපත් අංකය | මුදල රු :ශ | ව්‍යාපාරය ලියාපදිංචි කළ දිනය | භාණ්ඩ ද්‍රව්‍ය සපයන අයිතමය හා අංකය | ව්‍යාපාරය ලියාපදිංචි අංකය |
| 1 | ජෙස්ටර්නේටර් ඔප් සිලොන් පිඑල්සි | 248,වෝෂෝල්විදිය ,කොළඹ 02. | **2021.11.08** | **27406** | **1500** | **2009.01.13** | 03ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | **P.Q.215** |
| 2 | ලලන්ස් ස්පොර්ට්ස් ගුඩ්ස් | කොළඹපාර,මලන්ගම, හිද්දැල්ලෙන ,රත්නපුර | **2021.11.09** | **27448** | **1500** | **2008.0804** | 32 ක්‍රිඩා උපකරණ අලුත්වැඩියාව | **P.V.6112** |
| 3 | දිනපාල ප්‍රයිවේට් ලිමිටඩ් | නො:32,හරස්විදිය. මහනුවර. | **2021.11.09** | **27449** | **3000** | **2009.07..22** | 03ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | **P.V.14801** |
| 4 | දිනපාල ප්‍රයිවේට් ලිමිටඩ් | නො:32,හරස්විදිය. මහනුවර. | **2021.11.09** | **27449** | **3000** | **2009.07..22** | 04 කාර්යාලිය උපකරණ වානේ හා දැව | **P.V.14801** |
| 5 | සුපිරි ටයර් හවුස ප්‍රයිවේට් ලිමිටඩ් | අංක : 316. විලියම්ගොපල්ලව මාවත මහනුවර | **2021.11.10** | **27470** | **1500** | **2009.02.14** | 21 ටයර් ටියුබ් බැටරි | **P.V.67064** |
| 6 | නිව් ජෙම් සිටි පෞ: සමාගම | අංක : 161. කෙලින්විදිය .මහනුවර | **2021.11.10** | **27471** | **1500** | **2008.10.29** | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | **6** |
| 7 | එල්.එච්.චන්ද්‍රසේකර සහ සහෝදරයෝ ප්‍රාලි: | අංක :80, රජවිදිය ,මහනුවර. | **2021.12;11** | **27518** | **3000** | **2008.11.13** | 03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | **P.V.9290** |
| 8 | එල්.එච්.චන්ද්‍රසේකර සහ සහෝදරයෝ ප්‍රාලි: | අංක :80, රජවිදිය ,මහනුවර. | **2021.12;11** | **27518** | **3000** | **2008.11.13** | 05 කාර්යාලිය ලිපි ද්‍රව්‍ය | |
| 9 | ද ඔෆිස් සොප් පුද්: සමාගම | අංක: 27/14ඩී,ඇරුප්පොල .මහනුවර | **2021,11.15** | **27521** | **1500** | **2008.05.10** | 05 කාර්යාලිය ලිපි ද්‍රව්‍ය ටෝනර්,කාට්රිජ්,ර බන් | **P.V.3795** |
| 10 | රෝයි ඉලෙකට්‍රිකල්ස් | අංක : 161 ,සිරිමාවෝ බ: මාවත ,මහනුවර | **2021.11,15** | **27530** | **1500** | **1991.11.20** | 03ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | **CPC/KY/617** |
| 11 | සෙන්ට්‍රල් ස්ටේෂනරි | නො:189,කොළඹ , මහනුවර | **2021.11.15** | **27531** | **1500** | **2014.04.30** | 05 කාර්යාලිය ලිපි ද්‍රව්‍ය | **මප/මප්‍රාලේ/5/2/7200** |
| 12 | නිව් ජෙනර්ල් ට්‍රේඩින් | නො:06,කුමාර විදිය , මහනුවර. | **2021.11.15** | **27533** | **1500** | **2004.11.24** | 05 කාර්යාලිය ලිපි ද්‍රව්‍ය | **cpc/KY/DS/2/24838** |
| 13 | නදිකාස් | නො:33,කොත්මලේ පාර,නාවලපිටිය. | **2021.12.15** | **27532** | **1500** | **2004.06.03** | 05 කාර්යාලිය ලිපි ද්‍රව්‍ය | **මප්‍ර/පස්කෝ/ප්‍රාලේ/739** |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 12 | යු.කේ. ඉලෙක්ට්‍රිකල්ස් | නො:44/1පළමුහරස් විදිය කොළඹ11 | **2021.11.16** | **27549** | **1500** | **2017.06.29** | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | **ඒ/208686** |
| 13 | ගොල් ඉලෙක්ට්‍රිකල්ස් ඒජන්සිස් | අංක 71,යටිනුවර විදිය. මහනුවර | **2021.11.16** | **27550** | **1500** | **2011.01.28** | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | **P.V.76844** |
| 14 | සැම් ඇසෝසියේට් | අංක1,1 පළමු පරණ කැස්බෑව පාර,නුගේගොඩ | **2021.11.19** | **27584** | **1500** | **2003.04.01** | 27 විෂබීජනාශක | **409163319 7000** |
| 14 | සැම් ඇසෝසියේට් | අංක 1,1 පළමු පරණ කැස්බෑව පාර,නුගේගොඩ | **2021.11.19** | **27596** | **1500** | **2003.04.01** | 07 සනිපාරක්ෂ උපකරණ | **409163319 7000** |
| 15 | ඔඩියෝ විෂන් ට්‍රේඩින් ලිමිටඩ් | අංක 60,ප්‍රදිප් මාවත,මාලිගාවත්ත, කොළඹ 13 | **2021.11.19** | **27582** | **1500** | **2021.01.14** | 03 ඉලෙක්ට්‍රෙනික් උපකරණ උපාංග | **P.V.96819** |
| 16 | විනෝ ට්‍රේඩින් ප්‍රා:ලි: | නෙ:314-2/1,ඕල්ඩ් මූර්විදිය,මහනුවර. | **2021.11.19** | **27583** | **1500** | **2020.09.28** | 06 ජල නල උපාංග | **P.V.00228 173** |
| 17 | පෙර්රා ටයර් සේවිස් සෙන්ටර්, | නො: 773/1,නිව් මහනුවර පාර,මාලඹේ. | **2021.11.19** | **27581** | **1500** | **2008.08.08** | 21 රබර් ආශ්‍රිත උපකරණ | **P.V.6272** |
| 18 | ඒසියන් ඉලෙක්ට්‍රිකල්ස් | නො:95ඒ,පළමු හරස් විදිය,මහනුවර. | **2021.11.22.** | **27610** | **1500** | **1991.11.20** | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | **W12933** |
| 19 | ක්‍රවුන් ඉන්වෙස්ට්මන් ප්‍රා:ලි: | නො:186/39,මුදලි මාවත.වේයන්ගොඩ පාර,මිනුවන්ගොඩ | **2021.11.17** | **27563** | **1500** | **2007.10.10** | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | **P.V.671** |
| 20 | ක්‍රවුන් ටයර් ප්‍රා:ලි: | නො:155,සිරිමාවෝ බණ්ඩාර නායක මාවත.කොළඹ14 | **2021.11.26** | **27657** | **1500** | **2011.05.19** | 21 රබර් ආශ්‍රිත උපකරණ | **P.V.78919** |
| 21 | එම්.ජේ.ආර් පිරිස් සන්ස් | නො:194,කටුගස්තොට පාර,මහනුවර | **2021.11.26** | **27662** | **1500** | **2008.07.07** | 21 රබර් ආශ්‍රිත උපකරණ | **P.V.5085** |
| 22 | නිල් කමල් එස්වර්න් ප්ලාස්ටික් ප්‍රා:ලි: | නො:328,මැදපැත්තබ ටකේත්තර,පිළියන්දල | **2021.11.30** | **27708** | **1500** | **2009.06.08** | 04 කාර්යාලිය උපකරණ වානේ හා දැව | **P.V.13752** |
| 23 | ජේපර්ලයින් ට්‍රේඩින් ප්‍රා:ලි: | නො:14,හරස් විදිය ,මහනුවර. | **2021.11.30** | **27703** | **1500** | **2007.10.08** | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | **P.V.603** |
| 24 | ජේපර්ලයින් ට්‍රේඩින් ප්‍රා:ලි: | නො:14,හරස් විදිය ,මහනුවර. | **2021.11.30** | **27707** | **1500** | **2007.10.08** | 03 ඉලෙක්ට්‍රෙනික් උපකරණ උපාංග | **P.V.603** |
| 25 | ජේපර්ලයින් ට්‍රේඩින් ප්‍රා:ලි: | නො:14,හරස් විදිය ,මහනුවර. | **2021.11.30** | **27705** | **1500** | **2007.10.08** | 05 කාර්යාලිය ලිපි ද්‍රව්‍ය | **P.V.603** |
| 26 | ජේපර්ලයින් ට්‍රේඩින් ප්‍රා:ලි: | නො:14,හරස් විදිය ,මහනුවර. | **2021.11.31** | **27704** | **1500** | **2007.10.08** | 07 සනිපාරක්ෂ උපකරණ | **P.V.603** |
| 27 | ජයමාලිඑන්ටර්ප්‍රයිසස් | නො:20/20,නිදහස් මාවත,ගම්පොල | **2021.12.07** | **27763** | **1500** | **2015.06.12** | 10 වාහන සේවා කිරිම | **C.PC/DS/ UP/2541** |
| 28 | මහනුවර ඒජන්සිස් | නො:07,කුමාරවිදිය ,මහනුවර | **2021.12.07** | **27752** | **6000** | **1986.04.08** | 28 මුව සහ මුහුනු ආවරන හා ඇදුම් | **A19752** |
| 29 | මහනුවර ඒජන්සිස් | නො:07,කුමාරවිදිය ,මහනුවර | **2021.12.07** | **27752** | | **1986.04.08** | 28 විෂ බිජ නාශක | **A19752** |
| 30 | මහනුවර ඒජන්සිස් | නො:07,කුමාරවිදිය ,මහනුවර | **2021.12.07** | **27752** | | **1986.04.08** | 26ගොඩනැගිලි ද්‍රව්‍ය | **A19752** |
| 31 | මහනුවර ඒජන්සිස් | නො:07,කුමාරවිදිය ,මහනුවර | **2021.12.07** | **27752** | | **1986.04.08** | 27 තින්ත වර්ග | **A19752** |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 32 | එන්එම්අයි ඉන්ප්‍රා ප්‍රා:ලි: | නො:413,හැවලොක් පාර, කොළඹ06 | 2021.12.07 | 27754 | 1500 | 2009.07.09 | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | P.V.68373 |
| 33 | ධුමෝ සොලුෂන්, | නො:75,මල්වත්තගම, කුරුදුවත්ත කඩවිදිය | 2021.12.07 | 27756 | 1500 | 2019.11.26 | 28විෂ බිජ නාශක | මපස/ප්‍රලේ /ගඉ/1269 |
| 34 | නේට්වුවේ ප්‍රා:ලි: | නො:549,සිරිසංඝරාජ මාවත, මහනුවර | 2021.12,07 | 27757 | 1500 | 2018.02.28 | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | 4 |
| 35 | බිටුමික්ස් පුද්ගලික සමාගම | අදියර 02,ටෙම්පල් බර්ග් පනාගොඩ | 2021.12.07 | 27755 | 1500 | 2008.04.23 | 13 බිටුමන් ඉමල්සන් | P.V.3464 |
| 36 | ඊගල් ඉලෙක්ට්‍රිකල්ස් | නො:5,කුමාරවිදිය,මහ නුවර | 2021.12.03 | 27785 | 1500 | 1986.05.12 | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | A 19813 |
| 37 | ටෙලිපික්ස් ටෙක්නොලජි ප්‍රා:ලි: | නො:185, පේරාදෙණිය පාර,මහනුවර | 2021.12.03 | 27746 | 3000 | | 18 නාම පුවරු හා දැන්වීම් | |
| 38 | ටෙලිපික්ස් ටෙක්නොලජි ප්‍රා:ලි: | නො:185, පේරාදෙණිය පාර,මහනුවර | 2021.12.03 | 27746 | | | 17 මුද්‍රණ කටයුතු | |
| 35 | ශාන් ට්‍රේඩින් ප්‍රා:ලි: | නො:362, කොළඹපාර, කෙහෙල්වල,කිරිබත්කු ඹුර | 2021.12.08 | 27784 | 1500 | 1995.09.27 | 10 වාහන සේවා කිරිම | P.V.32 |
| 36 | ලිතුමේතාස් | නො:194/ඒ,කේසර විදිය,කොළඹ11 | 2021.12.07 | 27753 | 1500 | 2015.04.23 | 16 නිළ ඇදුම් | ඒ 54581 |
| 37 | ප්‍රිය ස්ටෝස් | නො:38,නුවරපාර, ගම්පොළ | 2021.12.08 | | 1500 | 1957.09.02 | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | ඒ 708 |
| 38 | ඒබිසි ඔටෝකේයා | නො:572/2,නාවලපිටිය පාර,උලපනේ | 2021,12.08 | 27791 | 3000 | 2015.02.25 | 08අලුත්වැඩියා කිරිම | මප/ගඉකො /ප්‍රාලේ/451 |
| 39 | ඒබිසි ඔටෝකේයා | නො:572/2,නාවලපිටිය පාර,උලපනේ | 2021,12.08 | 27791 | 3000 | 2015.02.25 | 10 වාහන සේවා කිරිම | මප/ගඉකො /ප්‍රාලේ/451 |
| 40 | බුමි ටෙක් ප්‍රා:ලි: | නො:184,හිල් ස්ට්‍රීට්,දෙහිවල. | 2021.12.13 | 27865 | 1500 | 2009.09.24 | 23 මැනුම් කටයුතු | P.V.16023 |
| 41 | සෙන්ට්‍රල් එජන්සිස් ප්‍රා:ලි: | නො:127,කොටුගොඩැ ල්ලවිදිය ,මහනුවර | 2021.12.13 | 27864 | 1500 | 2009.04.20 | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | P.V.12896 |
| 42 | ටෙලිසොනික් ලංකා | නො:18,දසියා විලා වෙනු,කොළඹ 04 | 2021.12.16 | 27912 | 1500 | 1999.03.19 | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | W.A.22425 |
| 43 | ජේඑස්බි ට්‍රේඩින් ප්‍රා:ලි: | නො:1566/2ඊ/2,සිරිම ල්වත්ත, පන්නිපිටිය | 2021.12.16 | 27915 | 3000 | 2015.06.25 | 10 වාහන අලුත් වැඩියා කිරිම | P.V.10655 9 |
| 44 | ජේඑස්බි ට්‍රේඩින් ප්‍රා:ලි: | නො:1566/2ඊ/2,සිරිම ල්වත්ත, පන්නිපිටිය | 2021.12.16 | 27915 | 3000 | 2015.06.25 | 10 වාහන සේවා කිරිම | P.V.10655 9 |
| 45 | තරිදු ඩිජිටල් ප්‍රින්ටින්, | නො:232,අඹගමුව පාර,ගම්පොළ | 2021.12.16 | 27906 | 1500 | 2018.09.11 | 17 මුද්‍රණ කටයුතු | මපස/ප්‍රලේ /දො/744 |
| 46 | ඩීසල් ඇන්ඩ්මෝටර්ඉංජිනියරි න් පිඑල්සි | නො:65,ජේතවන පාර, කොළඹ 14 | 2021.12.16 | 27916 | 6000 | 2008.05.09 | 02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග | P.Q146 |
| 47 | ඩීසල් ඇන්ඩ්මෝටර්ඉංජිනියරි න් පිඑල්සි | නො:65,ජේතවන පාර, කොළඹ 14 | 2021.12.16 | 27916 | | 2008.05.09 | 14ඉදිකිරීම් උපකරණ හාවාහන සැපයිම | P.Q146 |
| 48 | ඩීසල් ඇන්ඩ්මෝටර්ඉංජිනියරි න් පිඑල්සි | නො:65,ජේතවන පාර, කොළඹ 14 | 2021.12.16 | 27916 | | 2008.05.09 | තින්ත | P.Q146 |
| 49 | ඩීසල් ඇන්ඩ්මෝටර්ඉංජිනියරි න් පිඑල්සි | නො:65,ජේතවන පාර, කොළඹ 14 | 2021.12.16 | 27916 | | 2008.05.09 | ටයර් හා ටියුබ් | P.Q146 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 50 | නාවලපිටිය ඔටෝ කේයා | මල්ලන්ද ,නාවලපිටිය. | | | 3000 | 2011.06.03 | 10 වාහන අලුත් වැඩියා කිරීම | මපස/කොත්/ප්‍රාලේ/943 |
| 51 | නාවලපිටිය ඔටෝ කේයා | මල්ලන්ද ,නාවලපිටිය. | | | | 2011.06.03 | වාහන සේවා කිරම | මපස/කොත්/ප්‍රාලේ/943 |
| 52 | කළණ ලේක් වර්ක්ෂ් | නො:22/14,නිදහස් මාවත, ගම්පොළ | 2021.12.20 | 27945 | 1500 | 2011.08.26 | 10 වාහන අලුත් වැඩියා කිරීම හා ලියන පට්ටල්වැඩ | මපස/ප්‍රාලේ/උඩ/2138 |
| 53 | වෝටර්කේයා ටෙක්නොලජිප්‍ර:ලි: | නො:77,කටුවන ,හෝමාගම | 2021.12.17 | 27938 | 1500 | 2013.02.08 | 28විෂ බීජ නාශක | P.V.11535 |
| 54 | පි .කේ, යු .සි .ඉන්ටර්නැෂනල් ප්‍ර:ලි: | ඒ. 1 කර්මාන්තපුරය, ගලිගමුව | 2021.12.17 | 27939 | 1500 | 2011.04.05 | 13 බිටුමන් ඉමල්සන් | P.V.78198 |
| 55 | ඔවාටා ෆෝම් ප්‍ර:ලි: | නො:91,/6,නුගදෙණිය පාර,තලංගම දකුණ,බත්තරමුල්ල | 2021.12.21 | 27967 | 1500 | 2008.04.02 | 17 මුද්‍රණ කටයුතු | P.V.63685 |
| | ජෝන් කිල්ස් ඔටෝමේෂන් | නො:90,යුනියන් පෙදෙස, කොළඹ02 | 2021.12.23 | 27982 | 4500 | 2007.06.27 | 03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | P.V.127 |
| | ජෝන් කිල්ස් ඔටෝමේෂන් | නො:90,යුනියන් පෙදෙස, කොළඹ02 | 2021.12.23 | 27982 | | 2007.06.27 | 05 කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | P.V.127 |
| 56 | ජෝන් කිල්ස් ඔටෝමේෂන් | නො:90,යුනියන් පෙදෙස, කොළඹ02 | 2021.12.23 | 27982 | | 2007.06.27 | 30 ඡායාපිටපත්යන්ත්‍ර සේවා කිරීම | P.V.127 |
| 57 | රීගල් හාඩ්වෙයාර් | නො:40,කොළඹවිදිය ,මහනුවර. | 2021.12.27 | 28031 | 1500 | 1977.01,24 | 26ගොඩනැගිලි ද්‍රව්‍ය | A.1667 |
| 58 | ග්‍රීන් ලයින් ඔෆස් ඔටෝමේෂන් | නො:113,විහාර මාවත,මහනුවර | 2021.12.27 | 28033 | 1500 | 2013.03.21 | 03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | CP/KD/5/2/6826 |
| 59 | නිටි ලංකා ප්‍ර:ලි: | නො:455/1/ඒ, ගාල්ලපාර,කොළඹ 06 | 2021.12.27 | 28032 | 1500 | 2008.03.26 | 03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | P.V.3001 |
| | කේ.ඊ.දිනපාල ඇන්ඩ් කොම්පැණි | නො:80,කොටුගොඩැල්ල විදිය,මහනුවර | 2021.12.28 | 28062 | | 2017.03.27 | 04 කාර්යාලීය උපකරණ වානේ හා දැව | A.2472 |
| 60 | කේ.ඊ.දිනපාල ඇන්ඩ් කොම්පැණි | නො:80,කොටුගොඩැල්ල විදිය,මහනුවර | 2021.12.28 | 28062 | 3000 | 2017.03.27 | 03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | A.2472 |
| 61 | එන්එස්එල් ඩිස්ට්‍රිබියුටර් ප්‍ර:ලි: | නො: 202/2, පළමු විදිය ,බොරලැස්ගමුව | 2021.12.28 | 28061 | 1500 | 2018.02.23 | 03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | P.V.130174 |
| 62 | ඩයිනමික්ස් ඒවි ටෙක්නොලජි ප්‍ර:ලි: | නො:17,ලැයුරිස් පෙදෙස, කොළඹ 04 | 2021.12.29 | 28080 | 1500 | 2008.07.24 | 03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග | P.V.64937 |
| 63 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි ප්‍ර:ලි: | නො: 7බී,1/3,ප්‍රිම්රෝස් පාර,මහනුවර | 2021.12.30 | 28108 | 4500 | 2008.11.14 | 31 සේවා කිරීම අලුත් වැඩියා කිරීම කොම්පියුටර්පින්ටර් | P.V.9395 |
| 64 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි ප්‍ර:ලි: | නො: 7බී,1/3,ප්‍රිම්රෝස් පාර,මහනුවර | 2021.12.30 | 28108 | 3000 | 2008.11.14 | 30 ඡායපිටපත් යන්ත්‍ර සේවා කිරීම | P.V.9395 |
| | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි ප්‍ර:ලි: | නො: 7බී,1/3,ප්‍රිම්රෝස් පාර,මහනුවර | 2021.12.30 | 28108 | | 2008.11.14 | 05 කාර්යාලීය ලිපි ද්‍රව්‍ය | P.V.9395 |
| | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි ප්‍ර:ලි: | නො: 7බී,1/3,ප්‍රිම්රෝස් පාර,මහනුවර | 2021.12.30 | 28108 | | 2008.11.14 | 04 කාර්යාලීය උපකරණ වානේ හා දැව | P.V.9395 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෙට්‍රිපොලිටන් ටෙක්නොලජි ප්‍ර:ලි: | නො: 7බී,1/3,ප්‍රිම්රෝස් පාර,මහනුවර | **2021.12.30** | **28108** | | **2008.11.14** | **02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග** | **P.V.9395** |
| 65 | නිව් ශාස්තෝදය ප්‍රින්ටර් ප්‍ර:ලි: | නො: 10,මිහිඳු මාවත,කුලියාපිටිය | **2021.12.30** | **28110** | **1500** | **2009.08.13** | **17 මුද්‍රණ කටයුතු** | **P.V.68793** |
| 66 | නිව් කැන්ඩියන් ටයර් සෙන්ටර් | නො:346,කොළඹපාර, කඩුගන්නාව | **2021.12.31** | **28121** | **1500** | **2002.06.19** | ටයර් හා ටියුබ් | **මපස/ප්‍රාලේ/යනු/2082** |
| 67 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග** | **මපස/මනු/174** |
| 68 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **04 කාර්යාලිය උපකරණ වානේ හා දැව** | **මපස/මනු/174** |
| 69 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **06 ජල නල උපාංග** | **මපස/මනු/174** |
| 70 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **15පෙර නිමවුම් බෝක්කු බට,ඉන්ටර්ලොක් ගල්** | **මපස/මනු/174** |
| 71 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **20 තීන්ත** | **මපස/මනු/174** |
| 72 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **25 කොහු බත්** | **මපස/මනු/174** |
| 73 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **26 ගොඩනැගිලි ද්‍රව්‍ය** | **මපස/මනු/174** |
| 74 | උපාලි හාඩ්වෙයාර්, | නව ගන්නෝරුව පාර, පේරාදෙණිය | **2021.12.31** | **28141** | **12000** | **1991.12.31** | **29 කාබනික පොහොර ඇසුරුම් මලු** | **මපස/මනු/174** |
| 75 | විතානගේ එන්ටප්‍රයිසස්, | නො:20/5, 279 ඒ/විලියම්ගොපල්ලව මාවත, මහනුවර | **2021.12.31** | **28142** | **1500** | **2013.10.01** | **03 ඉලෙක්ට්‍රොනික් උපකරණ උපාංග** | **මපස/මප්‍රාලේ/5/2/6973** |
| 76 | ජයපුර ට්‍රේඩින් | නො:11, නාවලපිටිය පාර, ගම්පොළ | **2021.12.31** | **28145** | **1500** | | **26 ගොඩනැගිලි ද්‍රව්‍ය** | **CPC/DS/UP/1644** |
| 77 | රෝෂාන් ඔටෝ ඉලෙක්ට්‍රිකල්ස් ඇන්ඩ් මොටර්ස් | නො:240/2, නුවර පාර, කහටපිටිය,ගම්පොළ | **2021.12.31** | **28146** | **1500** | **2015.10.26** | වාහන සේවා කිරම | **මපස/ප්‍රාලේ/ උප/2587** |
| 78 | ඇට්ලස් ඉලෙක්ට්‍රිකල්ස්, | නො:72 ඒ ,යටිනුවරවිදිය, මහනුවර | **2021.12.31** | **28161** | **1500** | **2010.03.16** | **02 විදුලි උපකරණ හා විදි පහන් පහන් වර්ග** | **CPC/KY/DS/2/2/6028** |
| 79 | ඉන්ද්‍ර ට්‍රේඩර්ස් ප්‍ර:ලි: | නො: 175,කටුගස්කොටපාර, මහනුවර | **2021.12.31** | **28159** | **1500** | **2018.02.03** | වාහන සේවා කිරම | **P.V.2349** |
| 80 | ඉන්ද්‍ර ට්‍රේඩර්ස් ප්‍ර:ලි: | නො: 175,කටුගස්තොටපාර, මහනුවර | **2021.12.31** | **28160** | **1500** | **2018.02.03** | **10 වාහන අලුත් වැඩියා කිරීම** | **P.V.2349** |
| 81 | ෂියාබා කොත්මලේ හියුම් පයිප් | නො:08,කර්මාන්තපුරය , නාවලපිටිය පාර,උලපනේ | **2021.12.31** | **28162** | **1000** | **2009.09.09** | **15පෙර නිමවුම් බෝක්කු බට,ඉන්ටර්ලොක් ගල්** | **මපස/ගඉකෝ 615** |
| 82 | ලලන්ස් ඉංජිනියර්ස් | නො: 255, හයිලෙවල "පාර,මොරකැටිය | **2021.12.31** | **28182** | **1500** | **1995.06.28** | **32 ක්‍රීඩා උපකරණ අලුත්වැඩියාව** | **W.38692** |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 83 | රජයේ වාණිජ විවිධ නිති ගත සංස්ථාව | නො:449,විලයම්ලොප ල්ලව මාවත,මහනුවර | 2021.12.27 | 28035 | 3000 | 2010.10.01 | 05 කාර්යාලිය ලිපි ද්‍රව්‍ය | P.B.863 |
| 84 | රජයේ වාණිජ විවිධ නිති ගත සංස්ථාව | නො:449,විලයම්ගොප ල්ලව මාවත,මහනුවර | 2021.12.27 | 28035 | 3000 | 2010.10.01 | 07 සනිපාරක්‍ෂ උපකරණ | P.B.863 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩි.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගග ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ2022 වර්ෂයට අදාළව විවිධ අයිතමයන් වෙනුවෙන් සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීම මේ වන විට අවසන් කර තිබෙනවා. ඒ සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව කිසිත් අදහසක් ඉදිරිපත්නොවනබවත් ඒ සඳහා විරුද්ධත්වයක්නොමැතිබවත් පෙනීයනවා.

තීරණය:-

ඒ අනුව 2022 වර්ෂයේ විවිධ අයිතමයන් වෙනුවෙන් ගගඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවටගරු මහා සභාවතීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06. යථාපරිදිකල්දීනොමැති යෝජනා /හදිසියෝජනා - ඇත

## 06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගග ඉහළ කෝරළේ පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමෙන් පසු ඉතිරි වී ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කර ගැනීමට මේ වන විටත් තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති නමුත් එහි තක්සේරු වාර්තා ලැබී නොමැති අතර එහෙත් එම ද්‍රව්‍ය උපයෝගි කර ගනිමින් කුරුඳුවත්ත ක්‍රීඩාපිටියේ එක්රැස් කර ඇති ඇතැම් ගබඩා ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ තබා ගැනීම සඳහා තාවකාලිකව ගොඩනගන ගබඩා පරිශ්‍රයට එම ද්‍රව්‍ය යොදා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමෙන් පසු ඉතිරි වී ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය වෙන්දේසි කිරීම සඳහා තක්සේරු කර ගැනීමට මේ වන විටත් තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති නමුත් එහි තක්සේරු වාර්තා ලැබී නොමැත. එහෙත් එම ද්‍රව්‍ය උපයෝගි කර ගනිමින් කුරුඳුවත්ත ක්‍රීඩාපිටියේ එක්රැස් කර ඇති ඇතැම් ගබඩා ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ තබා ගැනීම සඳහා තාවකාලිකව ගොඩනගන ගබඩා පරිශ්‍රයට එම ද්‍රව්‍ය යොදා තාවකාලිකව සකස් කිරීමට නියමිත ගොඩනැගිල්ල සඳහා යොදා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබව හා විරුද්ධත්වයක්නොමැතිබවපෙනීයනවා.

තීරණය:-

ඒ අනුවගඟ ඉහළ කෝරළේ පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමෙන් පසු ඉතිරි වී ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය උපයෝගි කර ගනිමින් කුරුඳුවත්ත ක්‍රීඩාපිටියේ එක්රැස් කර ඇති ඇතැම් ගබඩා ද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ තබා ගැනීමට තාවකාලිකව ගොඩනගන ගබඩා පරිශ්‍රය සඳහා එම ද්‍රව්‍ය යොදා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

කුරුඳුවත්ත නගරයේ පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදි කිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමෙන් පසුව එම ගොඩනැගිල්ලෙන් පළමු මහල කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සහ කාගීල්ස් ෆුඩ් කම්පැනි පුද්ගලික ආයතනය පවත්වාගෙන යාම සඳහා ලබා දෙන ලෙස එම ආයතන ප්‍රධානීන් විසින් ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම් වලට අනුව ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව නව වෙළඳ සංකීර්ණය ඉදිවූ පසුව එම ගොඩනැගිල්ලෙහි පළමු මහල කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සහ කාගීල්ස් ෆුඩ් කම්පැනි පුද්ගලික ආයතනය පවත්වාගෙන යාම සඳහා රජයේ තක්සේරුවටිනාකම අනුව බදු පදනම මත ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

කුරුඳුවත්ත නගරයේ පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදි කිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමෙන් පසුව එම ගොඩනැගිල්ලෙන් පළමු මහල කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සහ කාගීල්ස් ෆුඩ් කම්පැනි පුද්ගලික ආයතනය පවත්වාගෙන යාම සඳහා ලබා දෙන ලෙස එම ආයතන ප්‍රධානීන් විසින් ඉල්ලීමක් කර ඇත. එම ඉල්ලීම් වලට අනුව ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව නව වෙළඳ සංකීර්ණය ඉදිවූ පසුව එම ගොඩනැගිල්ලෙහි පළමු මහල කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සහ කාගීල්ස් ෆුඩ්

**කම්පැනි පුද්ගලික ආයතනය පවත්වාගෙන යාම සඳහා රජයේ තක්සේරු වටිනාකම අනුව බදු පදනම මත ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.**

**තීරණයඃ-**

**කුරුඳුවත්ත නගරයේ පැරණි ප්‍රාදේශීය සභා භූමියේ ඉදි කිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමෙන් පසුව ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව එම ගොඩනැගිල්ලෙහි පළමු මහල කුරුඳුවත්ත ලංකා බැංකු ශාඛාව සහ කාගිල්ස් ෆුඩ් කම්පැනි පුද්ගලික ආයතනය පවත්වාගෙන යාම සඳහා රජයේ තක්සේරු වටිනාකම අනුව බදු පදනම මත ලබා දීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## 06:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළජනතාව සඳහා ලබා දෙන කොවිඩ් මර්ධන එන්නත ලබා දීමේ වැඩසටහන් 2021 ඔක්තෝබර් මස සිට 2021 දෙසැම්බර් මස දක්වා පැවැත්වූ අතර එම වැඩසටහන් වල රාජකාරි කටයුතු සිදුකළ නිලධාරීන්ට සහ සේවකයින් වෙනුවෙන් සංග්‍රහ කටයුතු සිදු කළ අතර එම ආහාරපාන සහ අනෙකුත් අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රුඃ 878,899.34 ක මුදලක් වැය කළ අතර එම වියදම් දැරීම වෙනුවෙන් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

| දිනය | ස්ථානය | වැඩසටහන | වියදම (රු) |
|---|---|---|---|
| 2021.10.12 හා 2021.10.13 | කුරුදුවත්ත රාජකිය විද්‍යාලය, උලපනේ රත්නාවලි විද්‍යාලය | වයස අවුරුදු 19ත් 29ත් තරුණ ප්‍රජාවට සයිනෆොම් එන්නත ලබා දිම | **154,195.14** |
| 2021.10.21 | කුරුදුවත්ත රාජකිය විද්‍යාලය | වයස අවුරුදු 18ත් 19ත් තරුණ ප්‍රජාවට ෆයිසර් එන්නත ලබා දිම | **25,609.14** |
| 2021.10.28 | කුරුදුවත්ත රාජකිය විද්‍යාලය | වයස අවුරුදු 16ත් 17ත් තරුණ ප්‍රජාවට ෆයිසර් එන්නත ලබා දිම | **61,001.14** |
| 2021.11.15 හා 2021.11.16 | කුරුදුවත්ත හා ඇත්ගාල මහජන ක්‍රිඩාංගන | සයිනෆාම් දෙවන එන්නත් මාත්‍රාව ලබා දිම | **123,919.64** |
| 2021.12.13 හා 2021.12.14 | කුරුදුවත්ත හා ඇත්ගාල මහජන ක්‍රිඩාංගන | ෆයිසර් බුස්ටර් එන්නත් ලබා දිම වයස 60ට වැඩි | **169,381.14** |
| 2021.12.27 සිට 2021.12.31 දක්වා | කුරුදුවත්ත රාජකිය විද්‍යාලය, උලපනේ රත්නාවලි විද්‍යාලය | ෆයිසර් බුස්ටර් එන්නත් ලබා දිම වයස 20ට වැඩි | **344,793.14** |
| මුළු වියදම | | | **878,899.34** |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජනතාව සඳහා ලබා දෙන කොවිඩ් මර්ධන එන්නත ලබා දීමේ වැඩසටහන් 2021 ඔක්තෝබර් මස සිට 2021 දෙසැම්බර් මස දක්වා පැවැත්වූ අතර එම වැඩසටහන් වල රාජකාරි කටයුතු සිදුකළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ නිලධාරීන් හට සංග්‍රහ කටයුතු කිරීමත් එම වැඩසටහන් සඳහා අනෙකුත් අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් සභා අරමුදලින් මුදල් වියදම් කරන ලදි. සභා අරමුදලින් රු: 878,899.34 ක මුදලක් වියදම් කිරීම වෙනුවෙන් ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබව හා විරුද්ධත්වයක්නොමැතිබවපෙනීයනවා.

තීරණය:-

2021 ඔක්තෝබර් මස සිට 2021 දෙසැම්බර් මස දක්වා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව සඳහා ලබා දෙන කොවිඩ් මර්ධන එන්නත ලබාදීමේ වැඩසටහනේ වල රාජකාරි කටයුතු සිදුකළ නිලධාරීන්ට සහ සේවකයින් වෙනුවෙන් සංග්‍රහ කටයුතු සිදු කළ අතර එම ආහාරපාන සහ අනෙකුත් අවශ්‍යතාවයන් ඉටු කිරීම වෙනුවෙන් සභා අරමුදලින් රු: 878,899.34 ක මුදලක් වැය කළ අතර එම වියදම් දැරීම වෙනුවෙන් ගරුවිෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත, උලපනේ, ඇත්ගාල සහ කෙලිගෘප් පුස්තකාල පවත්වාගෙන යාම සඳහා පුස්තකාල මේ වන විට අවශ්‍ය සේවකයින් නොමැතිවීම හේතුවෙන් අඛණ්ඩව පවත්වාගෙනයාමේදී ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී ඇත. මේ වන විට සිටින්නේ එක් පුස්තකාලයාධිපති කෙනෙකු සහ එක් පුස්තකාල සහායිකාවක ඇති හෙයින් දැඩි අපහසුතාවයකට පත්ව ඇත. තවද අනුමත කාර්ය මණ්ඩල තනතුරු වල එක් පුස්තකාල සහායක තනතුරක්ද පුරප්පාඩුව පවතී. එම අපහසුතාවය මගහරවා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ගයක් ලෙස නව පුස්තකාල සහායක තනතුරු 03ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මු:රෙ: 71 යටතේ අනුමත කරගෙන ඉදිරි කටයුතු සිදු කරන ලෙස 2022.01.11 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කරන ලදි. ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත, උලපනේ, ඇත්ගාල සහ කෙලිගෘප් පුස්තකාල පවත්වාගෙන යාම සඳහා නව පුස්තකාල සහායක තනතුරු 03ක් සඳහා සභා අරමුදලින් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි**

**එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.**

**ගරු සභාපතිතුමා**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත, උලපනේ, ඇත්ගාල සහ කෙලිගෘප් පුස්තකාල 04 අවශ්‍ය සේවකයින් නොමැතිවීම හේතුවෙන් අඛණ්ඩව පවත්වාගෙනයාමේදී ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී ඇත. අප සභාවෙහි අනුමත කාර්ය මණ්ඩලයේ ඇත්තේ එක් පුස්තකාලයාධිපති තනතුරක් සහ පුස්තකාල සහායක තනතුරු 02ක් පමණි. එයින් එක් පුස්තකාල සහායිකාවක දැනට සේවය කරන අතර ඇයද මේ වන විට ගර්භණී තත්ත්වයේ පසුවෙයි. එක් පුස්තකාල සහායක තනතුරක් පුරප්පාඩුව පවතියි. මීට පෙරද පුස්තකාල සහායක තනතුරු 03ක් ඇති කිරීම සඳහා මු:රෙ: 71 යටතේ අයදුම්පත් ඉදිරිපත් කර ඇති නමුත් මේ දක්වා එයටද අනුමැතිය ලබාදී නොමැත. බල ප්‍රදේශයේ ජනතාවගේ සහ අනාගත පරපුරේ සුභ සිද්ධිය සැළසීම අපගේ යුතුකම බැවින් මෙම කරුණු සළකා බලා ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත, උලපනේ, ඇත්ගාල සහ කෙලිගෘප් පුස්තකාල පවත්වාගෙන යාම සඳහා නව පුස්තකාල සහායක තනතුරු 03ක් සඳහා සභා අරමුදලින් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව මා ගරු මහා සභාවේ අදහස් විමසා සිටිනවා.**

**ගරු සභාපතිතුමා**

**ගරු මහා සභාවේ එකඟතාවය නම් සභා අරමුදලින් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත නව පුස්තකාල සහායක තනතුරු 02ක් සේවයේ යොදවා ගැනීම සුදුසු බවට සහ එම කටයුතු සිදුකරන තෙක් දැනට සභාවේ සිටින නිලධාරිනියක මෙම පුස්තකාල පවත්වාගෙන යාම සඳහා යොමු කිරීම සුදුසු බවටයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබවත් ඒ සඳහා විරුද්ධත්වයක්නොමැතිබවත් පෙනීයනවා.**

**තීරණය:-**

**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත, උලපනේ, ඇත්ගාල සහ කෙලිගෘප් පුස්තකාල පවත්වාගෙන යාම සඳහා සභා අරමුදලින් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත නව පුස්තකාල සහායක තනතුරු 02ක් සේවයේ යොදවා ගැනීම සුදුසු බවට සහ එම කටයුතු සිදුකරන තෙක් දැනට සභාවේ සිටින නිලධාරිනියක මෙම පුස්තකාල පවත්වාගෙන යාම සඳහා යොමු කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කරන ලදි.**

## 06:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

**2022.01.11 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේදී ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම පිළිබඳව සාකච්ඡා කරන ලද අතර අප බල ප්‍රදේශයටද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඉදිරියේදී ඇති කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර ඒ සඳහා අප ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා පෙරපාසල් පාලිකා තනතුරු 01ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මු:රෙ: 71 යටතේ අනුමත කරගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්සුදීන් නිලාම් මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභාව සතුව පෙරපාසලක් ක්‍රියාත්මක කර ගැනීමේ අවශ්‍යතාවයක් පිළිබඳව 2022.01.11 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේදී පිළිබඳව සාකච්ඡා කරන ලද අතර අප බල ප්‍රදේශයටද මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඉදිරියේදී ඇති කර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර ඒ සඳහා අප ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා පෙරපාසල් පාලිකා තනතුරු 01ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මු:රෙ: 71 යටතේ අනුමත කරගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව මා ගරු මහා සභාවේ අදහස් විමසා සිටිනවා.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මහා සභාවේ එකඟතාවය නම් සභා පෙරපාසල් පාලිකා තනතුරු 01ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මු:රෙ: 71 යටතේ අනුමත කරගැනීම සුදුසු බවටයි. මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබවත් ඒ සඳහා විරුද්ධත්වයක්නොමැතිබවත් පෙනීයනවා.

<u>තීරණය:-</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සභාව සතුව පෙරපාසලක් ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින් අප ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා පෙරපාසල් පාලිකා තනතුරු 01ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් මු:රෙ: 71 යටතේ අනුමත කරගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## <u>06:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.</u>

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු වීම් සිදු කරන ගුරුවරයෙකු වශයෙන් කටයුතු කරන යූ.ජී.ආර්.එස්. වික්‍රමසිංහ මෙනවිය 2021.11.01. දින සිට සේවය කරන අතර කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම කාල සීමාව තුළ පුහුණුලාභීන් බඳවා ගැනීම නොකළ අතර නැවත නව පාඨමාලා 2022 ජනවාරි මස 03 වන දින සිට ආරම්භ කරන ලදි. ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලද මෙම ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ ව්‍යාපෘති වාර්තාවට අනුව උපයන ලද ආදායමෙන් 75% ක මුදලක් ගුරුවරියගේ දීමනාව ලෙස ගෙවිය යුතුව ඇත. එහෙත් 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වල සභාවට ඊ නැණ පියසින් ආදායමක් නොලැබුණි. එහෙත් මෙම ගුරුවරියට එම කාලසීමාව සඳහා දීමනාවක් ලබා දෙන ලෙස ඇය ඉල්ලීම් කර ඇත. ඒ අනුව පාඨමාලා නොපැවැත්වූ කාලයට අදාළව මෙම ගුරුවරියට සභා අරමුදලින් දීමනා ගෙවීමට ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩි.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත්වන පාසල් දරුවන්ට වෘත්තීය දැනුම ලබා දෙමින් ගුණාත්මක මහජන සේවාවක් සළසන ඊනැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුවීම් කටයුතු සිදු කළ ගුරුවරිය වෙනත් රැකියාවකට යාම හේතුවෙන් එම ආයතනයේ පුහුණුවීම් සිදු කිරීමට සඳහා නව ගුරුවරියක තෝරා ගත් අතර එම ගුරුවරිය 2021.11.01 දින සිට ඊනැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ සේවය කරයි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් මෙම කාල සීමාව තුළ පුහුණුලාභීන් බඳවා ගැනීම නොකළ අතර නැවත නව පාඨමාලා 2022 ජනවාරි මස 03 වන දින සිට ආරම්භ කරන ලදි. ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලද මෙම ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ ව්‍යාපෘති වාර්තාවට අනුව උපයන ලද ආදායමෙන් 75% ක මුදලක් ගුරුවරියගේ දීමනාව ලෙස ගෙවිය යුතුව ඇත. එහෙත් 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වල සභාවට ඊ නැණ පියසින් ආදායමක් නොලැබුණි. එහෙත් මෙම ගුරුවරියට එම කාලසීමාව සඳහා දීමනාවක් ලබා දෙන ලෙස ඇය ඉල්ලීම් කර ඇත. ඒ අනුව පාඨමාලා නොපැවැත්වූ කාලයට අදාළව මෙම ගුරුවරියට සභා අරමුදලින් දීමනා ගෙවීමට ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳ ගරු මහා සභාවේ එකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබවත් ඒ සඳහා විරුද්ධත්වයක්නොමැතිබවත් පෙනීයනවා.

තීරණය:-

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ඊ නැණ පියස පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුවීම් සිදු කරන ගුරුවරයෙකු වශයෙන් කටයුතු කරන යූ.පී.ආර්.එස්. වික්‍රමසිංහ මෙනවිය සේවය කරන ලද 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාස දෙක සඳහා මාසිකව රු: 10,000.00 බැගින් දීමනාවක් ගෙවීම සුදුසු බවටත්මෙම ගුරුවරියට සභා අරමුදලින් දීමනා ගෙවීම සඳහා ගරු විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 27 දරණ කඩ කාමරයේ බදු අයිතිය පී.පී.එයි. ස්වර්ණකාන්ති මිය වෙත පවරා ඇති අතර එම බදුකරු විසින් කඩ කාමරයේ බදු අයිතිය අයි.ඩී. ශ්‍යාමා කුමාරි අමරසිංහ මැදවෙල යන අයට පවරා දීමට එකඟතාවය ප්‍රකාශ කර ඇත. මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ 2016/3 චක්‍රලේඛ ප්‍රකාරව සපුරාලිය යුතු සියලු අවශ්‍යතා සපුරා ඇති බැවින් කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 27 දරණ කඩ කාමරයේ බදු අයිතිය අයි.ඩී. ශ්‍යාමා කුමාරි අමරසිංහ මැදවෙල යන අයට පවරා දීම සුදුසු බවටත් එම බදු අයිතිය මාරු කිරීමේදී නව තක්සේරුව අනුව සභාවට අය විය යුතු නව

තක්සේරුවට අනුව අය විය යුතු හිඟ එක්වන් මුදල වන රු: 212,000.00ක මුදලත් සභා තීරණය අනුව පැවරීමේ ගාස්තු රු: 75,000.00ක මුදලත් අය කර බදු අයිතිය මාරු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 27 දරණ කඩ කාමරයේ බදු අයිතිය පී.ජී.එයි. ස්වර්ණකාන්ති මිය වෙත පවරා ඇති අතර එම බදුකරු විසින් කඩ කාමරයේ බදු අයිතිය අයි.ඩී. ශ්‍යාමා කුමාරි අමරසිංහ මැදවෙල යන අයට පවරා දීමට එකඟතාවය ප්‍රකාශ කර ඇත. මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්තුමාගේ 2016/3 චක්‍රලේඛ ප්‍රකාරව සපුරාලිය යුතු සියලු අවශ්‍යතා සපුරා ඇති බැවින් කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 27 දරණ කඩ කාමරයේ බදු අයිතිය අයි.ඩී. ශ්‍යාමා කුමාරි අමරසිංහ මැදවෙල යන අයට පවරා දීම සුදුසු බවටත් එම බදු අයිතිය මාරු කිරීමේදී නව තක්සේරුව අනුව සභාවට අය විය යුතු නම් මාරු කිරීමේ මුදල් සහ කුලී තැන්පතු මුදල් අය කර බදු අයිතිය මාරු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව මා ගරු මහා සභාවේ අදහස් විමසා සිටිනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබව හා විරුද්ධත්වයක්නොමැතිබවපෙනීයනවා.

තීරණය:-

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව සතු කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණයේ අංක 27 දරණ කඩ කාමරයේ බදු අයිතිය අයි.ඩී. ශ්‍යාමා කුමාරි අමරසිංහ මැදවෙල යන අයට පවරා දීම සුදුසු බවටත් එම බදු අයිතිය මාරු කිරීමේදී නව තක්සේරුව අනුව සභාවට අය විය යුතු නව තක්සේරුවට අනුව අය විය යුතු හිඟ එක්වන් මුදල වන රු: 212,000.00ක මුදලත් සභා තීරණය අනුව පැවරීමේ ගාස්තු රු: 75,000.00ක මුදලත් අය කර බදු අයිතිය මාරු කිරීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:08 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 2006/02/(1/2) 2019.03.18 දිනැති අනුව පළාත් පාලන ආයතන වල ගරු සභාපතිතුමන්ලා සඳහා සංයුක්ත දීමනා ගෙවීම් හා නිළ වාහන රියදුරන් සඳහා සංයුක්ත දීමනා හා අතිකාල ගෙවීම පිළිබඳව උපදෙස් ලබා දී ඇති අතර එම උපදෙස් වලට අනුකූලව බල ප්‍රදේශයේ විශාලත්වය රාජකාරීවල අත්‍යවශ්‍ය ස්වභාවය ආදී කරුණු සැළකිල්ලට ගෙන මීට පෙර චක්‍රලේඛ මගින් සීමා කර ඇති සංයුක්ත දීමනා ප්‍රමාණයන් සභා තීරණය අනුව සංශෝධනය කර ගත හැකි බව දන්වා ඇත. ඒ අනුව ගරු සභාපතිතුමා සහ නිළ රථ රියදුරුන් රාජකාරී කටයුතු සිදු කරන ගමන් වාර අනුව ගෙවීම් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 2006/02/(1/2) 2019.03.18 දිනැති අනුව පළාත් පාලන ආයතන වල ගරු සභාපතිතුමන්ලා සඳහා සංයුක්ත දීමනා ගෙවීම් හා නිළ වාහන රියදුරන් සඳහා සංයුක්ත දීමනා හා අතිකාල ගෙවීම පිළිබඳව උපදෙස් ලබා දී ඇති අතර එම උපදෙස් වලට අනුකූලව බල ප්‍රදේශයේ විශාලත්වය රාජකාරීවල අත්‍යවශ්‍ය ස්වභාවය ආදී කරුණු සැළකිල්ලට ගෙන මීට පෙර චක්‍රලේඛ මගින් සීමා කර ඇති සංයුක්ත දීමනා ප්‍රමාණයන් සහා තීරණය අනුව සංශෝධනය කර ගත හැකි බව දන්වා ඇත. ඒ අනුව ගරු සභාපතිතුමා සහ නිළ රථ රියදුරුන් රාජකාරී කටයුතු සිදු කරන ගමන් වාර අනුව ගෙවීම් කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳ ගරු මහා සභාවේ එකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබවත් ඒ සඳහා විරුද්ධත්වයක්නොමැතිබවත් පෙනීයනවා.

තීරණයඃ-

බල ප්‍රදේශයේ විශාලත්වය රාජකාරීවල අත්‍යවශ්‍ය ස්වභාවය ආදී කරුණු සැළකිල්ලට ගෙන ගරු සභාපතිතුමා සහ නිළ රථ රියදුරුන් රාජකාරී කටයුතු සිදු කරන ගමන් වාර අනුව ගෙවීම් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:09 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මැදගොඩ හංදිය නව වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර එහි ඉදිවන කඩ කාමර එම ප්‍රදේශයේම සිටින ජනතාවට ලබා දීමට කටයුතු යොදා ඇති බැවින් අදාළ කඩ කාමර බදුකරුවන් තෝරාගැනිම සඳහා විධිමත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර පුවත් පතේ පළ කිරීම සුදුසු බවටත් කැඳවන ලද ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු රුඃ 3000.00 ක මුදලක්ද ආපසු නොගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් තැන්පත් මුදල වන රුඃ 5000.00ක් ලෙසද අය කිරීම සුදුසු බවටත් ගරු මහ සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්. නාලක වසන්ත අබේසේකර මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් උඩහේන්තැන්න මැදගොඩ හංදිය නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට අදාළව මිළ ගණන් කැඳවීම සඳහා පුවත් පතේ පළ කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා ගරු මහා සභාවේ

අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳ ගරු මහා සභාවේ ඒකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබවත් ඒ සඳහා විරුද්ධත්වයක්නොමැතිබවත් පෙනීයනවා.

තීරණය:-

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මැදගොඩ හංදිය නව වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වලට අදාළ කඩ කාමර බදු දීමට බදුකරුවන් තෝරාගැනිම සඳහා විධිමත් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර පුවත් පතේ පළ කිරීම සුදුසු බවටත් මිළගණන් කැඳවන ලද ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු රුː 3000.00 ක මුදලක්ද ආපසු නොගෙවන ටෙන්ඩර් ඇප තැන්පත් තැන්පත් මුදල වන රුː 5000.00ක් ලෙසද අය කිරීම සුදුසු බවටත් ගරු මහ සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 06:10 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවසභාගත කරන ලදි.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තාක්‍ෂණ සේවයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්‍ෂණ නිලධාරී ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මහතාගේ සය මාසික සේවා කාලය 2022.02.16 වන දිනෙන් අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය සළකා 2022.02.17 වන දින සිට ඉදිරියට මාස 06ක කාලයට අදාළව කොන්ත්‍රාත් පදනම මත නැවත සභා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ තාක්‍ෂණ සේවයේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්‍ෂණ නිලධාරී ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මහතාගේ සය මාසික සේවා කාලය 2022.02.16 වන දිනෙන් අවසන් වන බැවින් අප ප්‍රාදේශීය සභාව සඳහා තාක්‍ෂණ සේවා නිලධාරීන්ගේ දැඩි අවශ්‍යතාවයක් ඇති අතර එම සේවා අවශ්‍යතාවය සළකා 2022.02.17 වන දින සිට ඉදිරියට මාස 06ක කාලයට අදාළව කොන්ත්‍රාත් පදනම මත නැවත සභා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මෙම යෝජනාව පිළිබඳ ගරු මහා සභාවේ ඒකඟතාවය ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත්නොවනබවත් ඒ සඳහා විරුද්ධත්වයක්නොමැතිබවත් පෙනීයනවා.

තීරණයඃ-

ඒ අනුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින තාක්‍ෂණ නිලධාරී ඩබ්.එම්. මද්දුම බණ්ඩාර මහතාගේ සය මාසික සේවා කාලය 2022.02.16 වන දිනෙන් අවසන් වන බැවින් සේවා අවශ්‍යතාවය සළකා 2022.02.17 වන දින සිට ඉදිරියට මාස 06ක කාලයට අදාළව කොන්ත්‍රාත් පදනම මත නැවත සභා සේවයේ යොදවා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 07. කාරකසභා වාර්තාසළකාබැලීම

### 01.මුදල් හා ප්‍රතිපත්තිකාරකසභා වාර්තාව

2022.01.11වනදිනපැවතිමුදල් හා ප්‍රතිපත්ති කාරකසභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2021 වර්ෂයට අදාළආදායම්වියදම්පුරෝකථනයද, 2021 දෙසැම්බර් මසමුළු ලැබීම් රුඃ9,524,712.86 ක්ද මුළු වියදම රුඃ11,287,188.40 ක්ද විය. 2021 දෙසැම්බර් මසටඅදාළබැංකු සැසඳුම්ප්‍රකාශයද2022.01.11වනදිනමහනුවරවිගණනඅධිකාරී වෙත යොමුකර ඇත.

### 02. පරිසර කමිටු වාර්තාව

2022.01.11 වන දින පැවති පරිසර කමිටු වාර්තාව සභා ගත කරන ලදි.

### 03. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව

2022.01.11 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව සභා ගත කරන ලදි.

### 04. කාර්මික හා කර්මාන්ත කමිටු වාර්තාව

2022.01.11 වන දින පැවති කාර්මික හා කර්මාන්ත කමිටු වාර්තාව සභා ගත කරන ලදි.

## 08.සභාවේ මාසික ලැබීම් හා ගෙවීම් වාර්තාව

2021.12.21 සිට 2022.01.07වනදින දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

| අනු අං කය | දිනය | ආදයකයා | ගෙවීම් විස්තරය | වවුචර අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | 12/31/2021 | උඩහේන්තැන්න ගොවි සංවිධානය - උඩහේන්තැන්න | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ලෝකානන්ද විහාරස්ථානය අසලින් යන පල්ලෙකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 1294 | 25.00 | 891,102.37 |
| 2 | | උඩහේන්තැන්න ගොවි සංවිධානය - උඩහේන්තැන්න | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද මැදගොඩ හන්දියේ සිට අමුණේ වල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 1295 | 25.00 | 350,690.69 |
| 3 | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය - කුඩමාකේ | පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම වැඩසටහන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද කුඩමාකේ බෝව්ටියේ ධර්මතිලක මාවත සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 1296 | 3,279.30 | 173,978.00 |
| 4 | | කේ.ජී.ගයාන් නිරංජල මයා - ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරි මහතාට 2021 දෙසැම්බර් මස දීමනාව ගෙවීම. | 1297 | | 15,000.00 |
| 5 | | ටී.එම්.ආර්. දසනායක මෙනවිය - සංවර්ධන නිලධාරි (පරිසර අංශය) | උලපනේ කසල ප්‍රතිචක්‍රිකරණ මධ්‍යස්ථානයට කසල දහනයට අවශ්‍ය 37.5 ගෑස් සිලින්ඩර 02ක් ලබා ගැනීම වෙනුවෙන් ගත් අත්තිකාරම් මුදල පියවීම. | 1298 | 17,356.00 | |
| 6 | | ඩබ්. ජනජීව මයා - සංවර්ධන නිලධාරි ( වාහන ) | 252 -6525 කැබ් රථයේ 2021.12.24 සිට 2022.12.23 දක්වා ආදායම් බලපත්‍රය ගැනීමටගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1299 | 10,130.00 | |
| 7 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | වසර 02 ඉක්ම වූ කර්මාන්ත අතරැදවුම් 10% තැම්පත් ආදායමට ගැනීම ගිණුම් ගත කිරීම. | 1300 | 339,169.72 | |
| 8 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357015 අංක දරණ කුරුදුවත්ත පුස්තකාලයේ රවුටරය සඳහා බිල්පත ගෙවීම - 2021 නොවැම්බර් | 1301 | | 1,427.30 |
| 9 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357689 අංක දරණ කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2021 නෙවැම්බර් | 1302 | | 12,225.91 |
| 10 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357082 අංක දරණ ගරු උප සභාපතිතුමාගේ කාමරයේ දුරකථන ගාස්තු ගෙවීම - 2021 නොවැම්බර් | 1303 | | 1,274.19 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 11 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357690 අංක දරණ ඊ නැණ පියස දුරකථන ගාස්තු ගෙවීම - 2021 නොවැම්බර් | 1304 | | 1,427.30 |
| 12 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2352123 අංක දරණ ඇත්ගාල උප කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2021 ඔක්තෝබර් | 1305 | | 649.66 |
| 13 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2357510 අංක දරණ ගරු සභාපතිතුමාගේ කාමරයේ දුරකථන ගාස්තු ගෙවීම - 2021 නොවැම්බර් | 1306 | | 1,141.32 |
| 14 | | ශ්‍රී ලංකා ටෙලිකොම්, පී එල් සී - ගම්පොල | 081-2352123 අංක දරණ ඇත්ගාල උප කාර්යාලයේ දුරකථන ගාස්තු ගෙවීම - 2021 නොවැම්බර් | 1307 | | 611.79 |
| 15 | | අයි.පී ජයගොඩ මිය - මිනින්දෝරු | ඇල්ලවත්ත සිට දෙහිගස්තැන්න පාර සම්බන්ධ නඩු අංක L / 3802 අදල නීතිඥ ගාස්තු ගෙවීම. | 1308 | | 59,000.00 |
| 16 | | කේ. රූපසේන මයා - උලපනේ ( ABC AUTO SERVICE ) | CPRW- 1611 ට්‍රැක්ටරයට බ්‍රේක් ලයිනර් දැමීම වහලය හා ඔයිල් කාන්දුව සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1309 | | 10,150.00 |
| 17 | | කේ. රූපසේන මයා - උලපනේ ( ABC AUTO SERVICE ) | CPRW- 1611 ට්‍රැක්ටරයේ පැය 1241 සේවා වාරය සිදු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1310 | | 19,235.00 |
| 18 | | කේ. රූපසේන මයා - උලපනේ ( ABC AUTO SERVICE ) | CPYU - 8947 ත්‍රිරෝද රථයේ 1422 කි.මී සේවා වාරය සිදු කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම | 1311 | | 6,720.00 |
| 19 | | කේ බී පී එච් රංජිකා කුමාරි මෙනවිය - සංවර්ධන නිලධාරි (ප්‍රසම්පාදන) | රජයේ මුද්‍රණාලයෙන් ධාවන සටහන් පොත් 50ක් ලබා ගැනීම වෙනුවෙන් ගත් අත්තිකාරම් මුදල පියවීම. | 1312 | 6,000.00 | |
| 20 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය ලේඛණ අවශ්‍යතා සඳහා ඇමතුම් දින පොත් , ධාවන සටහන් , නිවාඩු ලේඛණ ජල උපකරණ , පිගන් , කෝප්ප , 2022 අය වැය ලේඛණ සකස් කිරීමට රෙක්සින් ආදිය ගෙන්වීම වෙනුවෙන් ගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1313 | 50,000.00 | |
| 21 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | Covid 19 එන්නත්කරණ වැඩ සටහන වයස 30ට වැඩි 2021.12.27 සිට 31 දින දක්වා (කුරුදුවත්ත හා උලපනේ) අවශ්‍ය වියදම් වෙනුවෙන් ගත් අත්තිකාරම් මුදල පියවීම. | 1314 | 48,420.00 | |
| 22 | | ආර්.එල් එදිරිවීර මයා - ඇත්ගාල | ඇත්ගාල පුස්තකාලයේ තීන්ත ආලේප කිරීම වෙනුවෙන් ගෙවීම. | 1315 | 25.00 | 38,330.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 23 | | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දේශීය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - කොළඹ 02 | 2021 වර්ෂය සඳහා දෙවන කාර්තුවට අදාල රු 25 මුද්දර ගාස්තු හා 10% මුද්දර බදු මුදල් දේශීය ආදයම් දෙපාර්තමේන්තුවට ගෙවීම | 1316 | | 3,425.00 |
| 24 | | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දේශීය ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුව - කොළඹ 03 | 2021 වර්ෂය සඳහා තුන්වන කාර්තුවට අදාල රු 25 මුද්දර ගාස්තු හා 10% මුද්දර බදු මුදල් දේශීය ආදයම් දෙපාර්තමේන්තුවට ගෙවීම | 1317 | | 7,000.00 |
| 25 | | සන් ලංකා ඔටෝ ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ් - කොළඹ 02 | **CPZA - 5420** මෝටර් ග්‍රේඩරයේ **Fuse and Relay Controller** පද්ධතිය අලුත් වැඩියා කිරිම වෙනුවෙන් ගෙවීම. | 1318 | 25.00 | 98,675.00 |
| 26 | | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විශ්‍රාම වැටුප් අරමුදල | 2021 ජූලි , අගෝසතු හා සැප්තැම්බර් මස පළාත් පාලන දායක විශ්‍රාම වැටුප් බිල්පත් ගෙවීම. | 1319 | | 18,056.01 |
| 27 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිමය පියවීම. | 1320 | 1,000.00 | |
| 28 | | කේ බී පී එච් රංජිකා කුමාරි මෙනවිය - සංවර්ධන නිලධාරි (ප්‍රසම්පාදන) | ඇත්ගාල පුස්තකාලයට අවශ්‍ය උපකරණ ගැනීම වෙනුවෙන් ගත් අත්තිකාරම් මුදල වන රු 25000 පියවීමේදී වැඩිපුර පියවූ රු 205 මුදල ආපසු ගෙවීම.. | 1321 | | 205.00 |
| 29 | | කේ.පි.පි.හේමමාලි මිය - කලමනාකරණ සේවා නිලධාරි ( බලපත්‍ර) | ගල්පාය ලැන්ටන්හිල් ජල සැයුමට බට ප්‍රවාහනයට කුලියට ගත් වාහනය වෙනුවෙන් අතින් වියදම් වු මුදල් ගෙවීම. | 1322 | | 1,800.00 |
| 30 | | ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | උලපනේ කසල මධ්‍යස්ථානයේ දෛනික පදනම මත සේවයේ යෙදෙන සෞඛ්‍ය කම්කරු 04 දෙනෙකු සඳහා 2021 දෙසැම්බර් මස වැටුප් ගෙවීම. | 1323 | | 89,656.47 |
| 31 | | දවස මධ්‍යස්ථානය - ගම්පොල | උලපනේ පුස්තකාලයට 2021 - ඔක්තෝබර් , නොවැම්බර් මාසවල මිල දී ගත් පුවත්පත් සඳහා බිල්පත ගෙවීම | 1324 | | 4,560.00 |
| 32 | | දවස මධ්‍යස්ථානය - ගම්පොල | ඇත්ගාල පුස්තකාලයට 2021 - අගෝස්තු , ඔක්තෝබර් , නොවැම්බර් මාසවල මිල දී ගත් පුවත්පත් සඳහා බිල්පත ගෙවීම | 1325 | | 10,560.00 |
| 33 | | සීමාසහිත සමුපකාර රක්ෂණ සමාගම - ගම්පොල | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ**CPZA 5420** මෝටර් ග්‍රේඩරයේ (2021.12.28 සිට 2022. 12.27 දක්වා ) රක්ෂණ සහතිකය ලබා ගැනීමට මුදල් ගෙවීම. | 1326 | | 68,235.85 |
| 34 | | රෙජිස්ට්‍රාර් ජනරාල් - ගම්පොල | 2020 නොවැම්බර් . දෙසැ මස නුවරඑළිය ඉඩම් රෙජිස්ට්‍රාර් කර්යාලයෙන් ලැබුණු මුද්දර ගාස්තු වෙනුවෙන් කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම. | 1327 | | 600.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 35 | | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය | 2021 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් මාස වලට අදල භූමි පර්යේෂණ ගාස්තු ගෙවීම. | 1328 | | 20,250.00 |
| 36 | | එම්.ජේ.ආර්. පීරිස් ඇන්ඩ් සන්ස් ප්‍රයිවට් ලිමිටඩ් - මහනුවර | **CPRD 1611**- 0926 අංක දරණ ට්‍රැක්ටර් සඳහා ටයර් 04ක් ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1329 | 25.00 | 59,720.60 |
| 37 | | කදුරට හාඩ්වෙයාර් - කුරුදුවත්ත | ගල්පාය ලැන්ටන්හිල් ජල සැයුමට 2" එල් බෝ 06ක් මුදල් ගෙවීම. | 1330 | | 1,440.00 |
| 38 | | කදුරට හාඩ්වෙයාර් - කුරුදුවත්ත | ගල්පාය ලැන්ටන්හිල් ජල සැයුමට එල් බෝ 04 ,බෙන්ඩ් 02 ,සොකට් 2" 04, වෑල් සොකට් 41ක් ආදිය ගැනීමට මුදල් ගෙවීම. | 1331 | | 4,380.00 |
| 39 | | ජේපර් ලයින් ට්‍රේඩින් පුද්ගලික සමාගම - මහනුවර | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය පරිඝණක කටයුතු සඳහා ටෝනර් හා රෝනියෝ ගෙන්වීම වෙනුවෙන් ගෙවීම | 1332 | | 34,980.77 |
| 40 | | සමගි ප්‍රජා මූල සංවිධානය - කුරුදුවත්ත | කුරුඳුවත්ත පුස්තකාලයේ ජල බිල් ගෙවීම - 2021 නොවැම්බර් | 1333 | | 120.00 |
| 41 | | එල්.එච්. චන්ද්‍රසේකර සහ පුත්‍රයෝ මහනුවර | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය පරිඝණක සදහා වර්ණ ප්‍රින්ටරයක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1334 | | 10,800.00 |
| 42 | | ජිනසේන පුද්ගලික සමාගම - මහනුවර | පදවා ගෙන යන තණකොළ කපන මැෂිම සේවා කිරිම වෙනුවෙන් ගෙවීම. | 1335 | | 3,000.00 |
| 43 | | ජෝන් කිල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ් - කොළඹ 02 | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ PC 061958 POTO COPY යන්ත්‍රය ට්‍රේ එක අලුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම. | 1336 | | 1,505.79 |
| 44 | | නිව් ජෙනරල් ට්‍රේඩින් - මහනුවර | ප්‍රාදේශීය සභා කාර්යාලීය කටයුතු සදහා ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1337 | | 6,965.00 |
| 45 | | සී/ස රාජ්‍ය වානිජ විවිධ නීතිගත සංස්ථාව - මහනුවර | ප්‍රාදේශීය සභා කාර්යාලීය කටයුතු සදහා ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම. | 1338 | | 1,901.70 |
| 46 | | සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි - කුරුදුවත්ත | 2021 වර්ෂය නොවැ , දෙසැ සඳහා ආහාර නියැදි ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1339 | | 4,990.00 |
| 47 | | බී.පී ගුරුදෙනිය මිය - පරිසර නිලධාරි | 2021 ජූලි , ඔක්තෝබර්, නොවැම්බර් මස පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබද තාක්ෂණ කමිටුවට සහභාගි වීම වෙනුවෙන් දීමනා ගෙවීම. | 1340 | | 1,500.00 |
| 48 | | ආර්.එම්.ඩී තලතා රත්නායක මිය - කළමනාකරණ සේවා නිලධාරි (සභා කටයුතු) | 2019 - ජනාධිපතිවරණය හා 2020 මැතිවරණ රාජකාරි වල ( තැපැල් ඡන්ද ) යෙදීම වෙනුවෙන් දීමනාව ගෙවීම. | 1341 | | 2,650.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 49 | | ඩබ්.එම්.යූ.එස් හරංගල මයා - ඉංජිනේරු | CPZA - 5420 මෝටර් ග්‍රේඩරයේ Fuse teler conttoler පද්ධතියේ අලුත් වැඩියාව පරීක්ෂාව හා නිර්දේශ නිකුත් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1342 | | 3,000.00 |
| 50 | | පී.ආර්.ඒ විජේසිංහ මයා - වැටකේදෙනිය | CPZA - 5189 බැකෝ ලෝඩරය ලබා ගැනීම වෙනුවෙන් ගෙවූ මුදල් ආපසු ගෙවීම. | 1343 | | 5,000.00 |
| 51 | | කලන ලේත් වර්ක්ස් - ගම්පොල | CPRW - 8888 ටේලරයේ ප්ලේට් එක අලුතින් සවි කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1344 | | 10,000.00 |
| 52 | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය - බොස්වෝඩ් | සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක සුවදගල නාවල මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 1345 | 16,549.19 | 125,400.00 |
| 53 | | එකමුතු ගොවි සංවිධානය - හලාගම | අත්‍යවශ්‍ය යටිතල පහසුකම් - 2021 යටතේ ක්‍රියාත්මක ඇත්ගාල උතුර වසමේ අඩක් නිමකර ඇති ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 1346 | 29,075.00 | 220,925.00 |
| 54 | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය - බොස්වෝඩ් | සභා අරමුදල් - 2021 යටතේ ක්‍රියාත්මක සුවදගල විමලසේන මහතාගේ නිවස අසලින් යන මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ මුදල් ගෙවීම. | 1347 | 16,503.57 | 125,049.32 |
| 55 | | ලේක් හවුස් - මහනුවර | කුරුඳුවත්ත හා උඩහේන්තැන්න නව වෙලඳ සංකීර්ණය ඉදිකිරීම ටෙන්ඩර් දැන්වීම ත්‍රෙයි භාෂාවෙන් පුවත්පතේ පල කිරීම වෙනුවෙන් ගෙවීම | 1348 | | 133,660.80 |
| 56 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | සේවක අභිප්‍රේරණය වෙනුවෙන් ඵලදායිතා පුහුණු වැඩසටහන 2021.12.19 පැවැත්වීම සඳහා ගත් අත්තිකාරම් මුදල් පියවීම. (ලංකා බැංකුව පරිත්‍යාග කළ මුදල) | 1349 | 50,000.00 | |
| 57 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | සේවක අභිප්‍රේරණය වෙනුවෙන් ඵලදායිතා පුහුණු වැඩසටහන 2021.12.19 පැවැත්වීම සඳහා ගත් අත්තිකාරම් මුදල් පියවීම. | 1350 | 20,000.00 | |
| 58 | | ලේකම් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව | සනිපාරක්ෂක කම්කරු තනතුරේ සේවය කළ ඒ. එම් රංජිත් මයාගෙන් අයවිය යුතු සේවක ණය ගිණුම් ගත නොවීම හේතුවෙන් එය නිවරැදි කිරීමට අදාළ මුදල ආදායමට ගැනිම | 1351 | 57,700.00 | |
| 59 | 1/7/2022 | සී/ස ගඟ ඉහළ කෝරලේ විවිධ සේවා සමූපකාර සමිතිය - කුරුදුවත්ත | 2021 දෙසැම්බර් 01 දින සිට 13 දින දක්වා ණය පදනම මත ලබාගත් ඉන්ධන වෙනුවෙන් ගෙවීම. ( මීට අදල විස්තර අමුණා ඇත ) | 1351 | | 182,604.80 |
| | | එකතුව | | | 665,307.78 | 2,845,580.64 |

## 09. වෙනත්

01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

02. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.ආනන්ද කුලතිලකමහතා අසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.චාමිකඅනුරාධරත්නායකමහතාඅසනීපවීම හේතුවෙන් අද දින නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලීමක් කර ඇත.

නිවාඩු අනුමත කරන ලදි.

05. උලපනේ ඩෙන්මාර් කසළ අංගනයේ නිෂ්පාදිත කොම්පෝස්ට් ව්‍යාපෘතියෙහි වර්තමාන තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කර ඇති වාර්තාව සභා ගත කරන ලදි.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වනබව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙනයාමට සහාය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 11.55 ට අවසන් කරන ලදි.

සභාපති

2022.01.18 වනදින ගඟ ඉහළකෝරළේ

ප්‍රාදේශීයසභා රැස්වීම්ශාලාවේදීය